


කේ.එම්.සෙනේජා දනාරා අනුත්මි කරුණාතිලක

# කුරුළු අම්මාගේ සිහිනය

කතෘ :- කේ.එම්.සෙනේජා දනාරා අනුත්මි කරුණාතිලක

කෘතිය පල කරන දිනය :- 2025-02-05

INSB අංකය :- 978-624-208-809-9

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණයකරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,<br>
විදුහල්පතිනිය,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.<br>
2023 . 10 . 20

# පිදුම

ආදරණීය ........

ගුරුමෑණියන්ටත්....

යහළු යෙහෙළියන්ටත් .....

ආදරයෙන් පුදමි! .......

## ස්තූතිය

මෙම පොත සකස් කිරීමට
මා හට උදව් කල
මගේ ආදරණීය...
දිල්රුක්ෂි ගුරුතුමීයටත්
යහළු යෙහෙළියන්ටත්
අනෙක් සියළු දෙනාටමත්
මගේ ස්තූතිය!

එකමත් එක කාලෙක පුංචි ගමක තිබුණ අඹ ගසක වටු කුරුළු කූඩුවක් තිබුණා. ඒ කූඩ්වේ වඩු කුරුල්ලන් දෙදෙනෙක් ජීවත් වුණා. මේ වටු කුරුල්ලන් දෙන්නා ඈත කැළයට ගොස් කෑම සොයාගන්නවා. ඉතින් මේ විදිහට දවස ගෙවමින් මේ වුටි කුරුල්ලන් ජීවත් වුණා.



කාලයක් ගෙවිලා ගියා. මේ වටු කුරුළු අම්මා බිත්තර දාලා පැටවුන් බිත්තරයෙන් එළියට එනතුරු නොඉවසිල්ලෙන් බලන් හිටියා. ඒසේ කාලය ගෙවෙද්දී එක දවසක් මේ වටු කුරුල්ලන් දෙන්නා වෙනදා වගේම ඈත කැළයට කෑම සොයා ගෙන එන්න ගියා.



අද නම් හරිම මහන්සියි කියමින් වටු කුරුළු අම්මා කූඩුව දෙස බැලුවා.

අනේ දෙවියනේ! මගේ මගේ මගේ බිත්තර කෝ , කියමින් වටු කුරුළු අම්මා කෑ ගසන්න ගත්තා.

වටු කුරුළු තාත්තත් එබිලා බැලුවා. වටු කුරුළු බිත්තර තිබුණේ නෑ... දෙදෙනාම හඬමින් වටපිට බැලුවා. අනේ! බිමත් වැටිලා නෑ..... කියා ආයෙමත් වටු කුරුළු අම්මා අඬන්න ගත්තා.



සතෙක්වත් ආවාද? අනේ මොකද වුනේ? මම කොච්චර ආසාවෙන්ද හිටියේ , පැටව් දැකගන්න. වටු කුරුළු අම්මා කිව්වා.

දැන් අඩන්න එපා, අපි හොයලා බලමු මොකද වුනේ කියලා. කියා වටු කුරුළු තාත්තා කිව්වා.



පසු දින උදෑසනින් ම අවදි වී වටු කුරුළු අම්මා නැවතත් හඩමින් හිටියා.

“යමු අපි ගිහින් කෑම සොයා ගෙන එමු“ කියා වටු කුරුළු තාත්තා කිව්වා.

“ අද මට බෑ ඔයා කෑම ටිකක් සොයාගෙන“ එන්න වටු කුරුළු අම්මා කීවා.

එහෙනම් පරිස්සමින් ඉන්න . මම ඉක්මනින් ගිහින් එන්නම් කියා වටු කුරුළු තාත්තා පිටව ගියා.



ටික වේලාවක් ගත වුණා. වටු කුරුළු තාත්තා දැක්කා දඩයම් කරන මිනිසුන් දෙදෙනෙකු කූඩුව තියෙන ගස පැත්තට එනවා. එක අයෙක් ගසට නැගලා කූඩුව තිබෙන තැනට ගොස් බලා බිමට බැස්සා. ඊට පස්සේ ඒ මිනිසුන් අද බිත්තර එකක්වත් නෑ . කියා එතනින් යන්න ගියා.



ටික වේලාවකින් වටු කුරුළු තාත්තා කෑම ටිකකුත් රැගෙන නැවත කූඩුව වෙත ආවා.

වටු කුරුළු තාත්තා , වටු කුරුළු අම්මාට මෙහෙම කිවා. අපි කූඩුවේ නැති විදිහට පොඩ්ඩක් හැංගිලා ඉමු,

කවුද මේ පැත්තට එන්නේ කියලා බලමු.

පසුව වටු කුරුළු තාත්තයි වටු කුරුළු අම්මයි ගසකට මුවා වී වටු කුරුළු කූඩුව දෙස බලා සිටියා.



වටු කුරුල්ලන්ට තේරුම් ගියා සිද්ද වෙල තිබුණ දේ.

" නරක මිනිස්සු , අපි කොච්චර අසාවෙන්ද හිටියේ කුරුළු පැටවෙක් දකින්න, මගේ සිහිනය, මේ නරක මිනිස්සු නැති කලා. අපිට ජීවත්වෙන්න මේ මිනිස්සු ඉඩක් දෙන්නෑ යනුවෙන් වටු කුරුළු අම්මා හඩමින් කිවා.

"මෙහෙ මිනිස්සු හරි නරකයි. මෙහෙ හිටියොත් කවදාවක් අපට අපේ පැටියෙක් බලන්න වෙන්නේ නෑ. ඒ නිසා අපි මෙහෙන් යමු. වටු කුරුළු තාත්තා කීවා. වටු කුරුළු අම්මයි තාත්තයි පියඹා ගොස් ඈත කැළයට යන්න ගියා.



අළුත් කැලයේ කූඩුවක් සදා ගෙන වටු කුරුල්ලන් ජීවත් වුණා.

ටික දවසක් ඉන්නකොට බිත්තර දාලා පැටව් කිහිප දෙනෙකු බිත්තර වලින් එළියට ආවා. වටු කරුළු අම්මටයි තාත්තාටයි හරිම සතුටුයි.



“මගේ සිහිනය. මගේ පැටව් . මට මගේ පැටව් දකින්න ලැබුණා“. කියමින් වටු කුරුළු අම්මා සතුටින් කෑ ගසන්න පටන් ගත්තා.

“අපි නරක මිනිස්සු එක්ක හිටියනම් අපේ සිහිනය කවදාවත් ඉටු කරගන්න වෙන්නේ නෑ. ආය කවදාවත් අපි එහේ යන්නේ නෑ“. කියමින් වටු කුරුළු තාත්තා වටු කුරුළු අම්මාට කීවා.

ඉන්පසු වටු කුරුළු අම්මත් තාත්තාත් කුරුළු පැටවුන් සමග සතුටින් ජීවත් වුණා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා ප්‍රංචි ගතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරණ කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියනෘ සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2025 - 02 - 05